# මහා මංගල සූත්‍රය

**ඒවං මේ සුතං,**
මා විසින් මෙසේ අසන ලදී.

**ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ,**
එක් සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

**අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්ඛන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි, ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.**
එකල්හි එක්තරා දෙවියෙකු රාත්‍රි පෙරයම ඉක්මගිය කල්හි ශරීරාලෝකයෙන් සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ සැළ කළේය.

**බහූදේවා මනුස්සා ච මංගලානි අචින්තයුං**
**ආකංඛමානා සොත්ථානං බ්‍රෑහි මංගල මුත්තමං**
මෙලොව පරලොව සැප කැමති බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල කාරණයන් ගැන සිතූහ.
භාග්‍යවතුන් වහන්ස, උතුම් මංගල කරුණු දේශණා කරන සේක්වා!

**අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා**
**පූජා ච පූජණීයානං - ඒතං මංගලමුත්තමං**
බාලයන් සේවනය නොකිරීම ද - පණ්ඩිතයන් ආශ්‍රය කිරීම ද
පිදිය යුත්තන් පිදීම ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**පතිරූපදේසවාසෝ ච - පුබ්බේ ච කත පුඤ්ඤතා**
**අත්තසම්මාපණිධි ච - ඒතං මංගලමුත්තමං**
සුදුසු ප්‍රදේශයක විසීම ද - පෙර කල පින් ඇති බව ද
සිත මනාව පිහිටුවා ගැනීම ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසුක්ඛිතෝ**
**සුභසිතා ච යා වාචා - ඒතං මංගලමුත්තමං**
බහුශ්‍රැත බව ද, ශිල්ප දැනීම ද - මනාව හික්මුණු විනය ඇති බව ද
සුභාෂිත වචන කීම ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**මාතා පිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංඝහෝ**
**අනාකුලා ච කම්මන්තා - ඒතං මංගලමුත්තමං**
මව් පිය උපස්ථානය ද - අඹු දරුවන්ට සංග්‍රහ කිරීම ද
නිරවුල් කර්මාන්ත ඇති බව ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**දානං ච ධම්ම චරියා ච - ඤාතකානඤ් ච සංගහෝ**
**අනවජ්ජානි කම්මානි - ඒතං මංගලමුත්තමං**
දන් දීම ද, ධර්මයෙහි හැසිරීම ද - නෑයන්ට සංග්‍රහ කිරීම ද
නිවැරදි ක්‍රියා ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගලමුත්තමං**
පාපයෙහි නො ඇලීම හා පවින් වැලකීම ද - මත්පැණින් වැලකීම ද
කුසල දහම්හි නොපමා බව ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**ගාර වෝ ච නිවාතෝ ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා**
**කාලේන ධම්මසවනං - ඒතං මංගලමුත්තමං**
ගරුකළ යුත්තන්ට ගරු කිරීම ද, යටහත් පහත් පැවතුම් ඇති බව ද - ලද
දෙයින් සතුටු වීම ද, කෙළෙහි ගුණ දන්නා බව ද
සුදුසු කාලයෙහි ධර්මය ඇසීම ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**ඛන්තී ච සෝවචස්සතා - සමණානඤ්ච දස්සනං**
**කාලේන ධම්මසාකච්ඡා - ඒතං මංගලමුත්තමං**
ඉවසීම ද, කීකරුකම ද - ශ්‍රමණයන් දැකීම ද
සුදුසු කාලයෙහි ධර්ම සකච්ඡාව ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**තපෝ ච බ්‍රහ්ම චරියා ච - අරියසච්චාන දස්සනං**
**නිබ්බානසච්ඡිකිරියා ච - ඒතං මංගලමුත්තමං**
තපස ද, බ්‍රහ්ම චර්යාව ද - ආර්ය සත්‍ය දර්ශනය ද
නිර්වාණාවබෝධය ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛේමං - ඒතං මංගලමුත්තමං**
අටලෝ දහමින් මඩනා ලද යමෙකුගේ සිත කම්පා නොවේ ද
ශෝක නැත්තේ ද, කෙළෙස් රහිත ද, නිර්භය භාවය ද - මේවා උතුම් මංගල කරුණු වේ.

**ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තේසං මංගලමුත්තමන්ති.**
මෙබඳු මංගල කාරණයන් සිදු කොට සියළු තැන නොපැරදී
සියළු තැන සැපයට යෙත් ද - මේවා උතුම් මංගල කරුණු වේ.